# සාමකාමී විරෝධතාකරුවන්ට එරෙහිව අනිසි ලෙස කඳුළු ගෑස් භාවිතා කිරීම හේතුවෙන් සිදු වූ නිමල් අමරසිරිගේ ඝාතනය ආසියානු මානව හිමිකම් කොමිසම හෙළා දකියි.

පළාත් පාලන මැතිවරණය කල්දැමීමේ උත්සාහයට එරෙහිව පසුගිය පෙබරවාරි 26 වෙනි දින පැවති විරෝධතාවයකට සහභාගී වෙමින් සිටි පළාත් පාලන ආයතනයක මැතිවරණයක අපේක්ෂකයෙක් වූ නිමල් අමරසිරි මහතා කඳුළු ගෑස් ප්‍රහාරයකින් මරණයට පත් විය. ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස හුදෙක් තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කරමින් සිටි මෙම විරෝධතාකරුවන්ට එරෙහිව කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම සඳහා යුක්ති සහගත පදනමක් කොහෙත් ම නොතිබුණි. මෙවැනි වාතාවරණයක් යටතේ කඳුළු ගෑස් භාවිතා කිරීම අනවශ්‍ය සහ නීති විරෝධී ක්‍රියාවක් විය. කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරන ලෙස නියෝග දුන් අය මෙන් ම එම නියෝග ක්‍රියාත්මක කළ නිලධාරීන් ද පුද්ගලයින් මරණයට පත්වීමට ඇති හැකියාව ඇතුළු බරපතළ හානි සිදුවීමට ඇති හැකියාව අපේක්ෂා කළ යුතුව තිබුණි. එම ක්‍රියාව ම නීතිවිරෝධී සහ වගකීම් විරහිත ක්‍රියාවක් බැවින්, එම ක්‍රියාව සිදුකර වූ අය එහි ප්‍රතිවිපාක පිළිබඳ, මෙම සිද්ධියේ දී නම් මරණය සිදුවීමට සැලැස්වීම පිළිබඳ වගකීම භාර ගත යුතු ය. එවැනි මරණයක් සිදු වීමට සැලැස්වීම අත්තනෝමතික ලෙස ජීවිතය අහිමි කිරීමකි.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ ඇති ඉතාමත් මූලික ම අයිතිවාසිකම් වලින් එකක් වන මැතිවරණයක් පවත්වනු ලැබීම සඳහා ජනතාවට ඇති ස්වෛරී අයිතීන් ප්‍රතික්ෂේප කරනු ලැබීමේ තර්ජනය මෙම විරෝධතාවලට පාදක වූ විෂය නිසා තත්ත්වය වඩාත් බරපතළ ය. නියමිත කාලසීමාව තුළ දී මැතිවරණ පවත්වනු ලැබීම සඳහා ඇති අයිතිය ප්‍රතික්ෂේප කරනු ලැබීම පුරවැසිභාවය පිළිබඳ සංකල්පයට ම එල්ල වූ ප්‍රහාරයකි. මේ අනුව, ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී ජන ජීවිතයට තර්ජනයක් නොවන බව සහතික කර ගැනීම සඳහා සාමකාමී උත්සාහයක නිරත වී සිටින විට පොලිසියේ සහ ආරක්ෂක අංශවල රාජකාරිය විය යුතුව තිබුණේ එම විරෝධතාකරුවන්ව ආරක්ෂා කිරීම යි. එහෙත් එසේ නොකර, ඉදිරියට එන ජනතාවට පහර දීම මගින් ඔවුන්ගේ රජය රාජ්‍ය පාලනය සහ නීතියේ ආධිපත්‍යය යටතේ ලබා දිය යුතු ආරක්ෂාව පිළිබඳ මූලික සංකල්පයට පටහැනිව කටයුතු කර තිබේ.

රජය නීතියේ ආධිපත්‍යයට පහර දෙන විට, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ ජීවත් වීම සඳහා ස්වෛරී අයිතියක් තිබෙන සහ ඒකාධිපති පාලනයක් යටතේ ජීවත් වීම පිළිබඳව වන කවර හෝ අදහසක් ප්‍රතික්ෂේප කර ඇති ජනතාව පාලනය කිරීමට රජයට සතු නීත්‍යානුකූලභාවය රජයට අහිමි වී යයි.

ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා මැතිවරණ කොමිසමට දොස් පැවරීම මගින් සහ මාර්තු 9 වෙනිදා මැතිවරණය පැවැත්වීමට ඇති අභිප්‍රායය ප්‍රකාශයට පත් කර තිබීම දෝෂාරෝපණයට ලක්කිරීම මගින් ඔහු ප්‍රදර්ශනය කළ ප්‍රකෝපකාරී හැසිරීම නිසා ඔහු ඍජුව ම වගකීම භාරගත යුතුය. ජනාධිපතිවරයා මැතිවරණ කොමිසමට දොස්පවරමින් පාර්ලිමේන්තුවේ දී පැවැත්වූ කථාව ප්‍රකෝපකාරී මෙන්ම සම්පූර්ණයෙන් ම නොමඟ යවන සුළු කථාවක් විය. රට තුළ සාමය පවත්වා ගැනීම රාජ්‍ය නායකයාගේ මූලික ම වගකීම වේ. ජාතික මට්ටමේ දී මෙන්ම ප්‍රාදේශීය මට්ටමේ දී ද තම නියෝජිතයින්ව තෝරා පත් කර ගැනීම සඳහා ඡන්දය දීමට මිනිසුන්ට ඇති අයිතිය වැනි මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් යටපත් කිරීමට රාජ්‍ය නායකයා තම ධුරය භාවිතා නොකළ යුතු බව මෙයින් ගම්‍යමාන වෙයි.

සාමය ආරක්ෂා කිරීම සඳහා ස්වකීය බලතල ඇතුළත කළ හැකි සියලු දේ කිරීම සමස්තයක් ලෙස රජයේ වගකීම වේ. කවර හෝ ප්‍රකෝපකාරී හැසිරීමක් ජාතික ජන ජීවිතයේ සෑම අංශයකට ම බාධා පමුණුවනවා පමණක් නොව, නිමල් අමරසිරිගේ මරණය වැනි මරණ සිදුවීමට ද හේතු වනු ඇත.

ශ්‍රී ලංකාව පසුගිය දශක කිහිපය තුළ ලේ වැගිරීම් බොහෝ සෙයින් දැක ඇත. මුල් ම ප්‍රකෝපකාරී ක්‍රියාවන් රජය නියෝජනය කරන පුද්ගලයින් අතින් ම සිදුවීම ම අවාසනාවට කරුණකි. රජය විසින් ම ප්‍රචණ්ඩත්වය අවුලුවාලීමේ මෙම පුරුද්ද වහා ම නැවැත්වීම අත්‍යාවශ්‍ය වේ.

ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා එවැනි ප්‍රකෝපකාරී හැසිරීම් අවශ්‍ය වන්නේ ය යන පදනම මත එවැනි ක්‍රියා සාධාරණීකරණය කිරීම හුදෙක් වෙනත් නීත්‍යානුකූල නොවන දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ව්‍යාජයකි.

මින් පෙර කිසි දිනෙක මෙතරම් බරපතල මට්ටමට පැමිණ නැති, දැරිය හැකි මිලකට ආහාර සහ අනෙකුත් අවශ්‍යතා සපයා ගැනීමට නොහැකිවීමේ ගැටළුව, දැරිය නොහැකි බදු බර සහ අධික විදුලි බිල ආදිය හේතුවෙන් ජනතාව පීඩාවට පත්ව සිටිති. එවැනි අහිමි කරනු ලැබීම් හේතුවෙන් සිදුවන මරණ දිනපතා සිදුවෙමින් පවතී. විරෝධතා පෙළපාලි පාලනය කිරීමේ මුවාවෙන් තවත් මරණ එයට එකතු කළ යුතු නැත.

ජාතියේ ජීවිතයට රැකවරණය සලසන මහා ඡත්‍රය වන ජීවත්වීමේ මූලික අයිතිය ආරක්ෂා කිරීමට සියලු පුරවැසියන්, දේශපාලන පක්ෂ, සිවිල් සමාජය සහ වෘත්තීය සංවිධාන නැගී සිටිය යුතු ය.

පොලිස් ස්ථානයක් තුළ දී නීති විරෝධී ඝාතන සිදු කිරීම ජීවත්වීමේ අයිතිය උල්ලංඝනය කිරීමක් වන බව මෑතක දී *මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා එදිරිව කේ.ඩබ්ලිව්.ජී. නිශාන්ත සහ තවත් අය නඩුවේ* දී ලබා දුන් තීන්දුක දී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ ය.

ජනාධිපති නීතිඥ, විනිසුරු අලුවිහාරේ මහතාගේ පහත සඳහන් නිරීක්ෂණ මෙහිදී අදාළ වේ: "... ***පොලීසියේ සේවයට යොදවා සිටින පුද්ගලයින් ස්වකීය රාජකාරියට ප්‍රවේශවීමේ දී අනුගමනය කරනු ලබන මුළුමනින් ම වෘත්තීයවේදීමය නොවන ප්‍රවේශය, සහ එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාව පොලිසිය කෙරෙහි තබා ඇති විශ්වාස සීඝ්‍රයෙන් නැති වී යමින් පවතියි. නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස එය විසින් දිනාගෙන තිබිය යුතු විශ්වාසනීයත්වය එයට අහිමි වී ඇත***" යනුවෙන් විනිසුරුතුමා අදහස් දැක්වූයේ ය.